## කවි කොළය



# ආසනික් බත්!

අප කන බත්වලත් පාසානම් ඇත්තේ
දෙවියෝ කියති එහි කිසි සැකයක් නැත්තේ
සරසවියකින් නමගිය කැළණිය පැත්තේ
නැගුණා හඬක් බත් කන අය තැති ගත්තේ

සරසවි ඇදුරෙකුගෙ බිරිඳක් සුවි නිත
මතු බුදුවෙතැයි පවසන දෙවියන් නාත
හමුවී අසා රඳවා හිස මත දෝත
පළකෙරුවේලු! මේ අදහස බහු බූත

සරසවි වනාහි යන විදු දැනුම සොයා
මංපෙත් විවර කරවන යෝදයෙකි කියා
සිතුවෙමු මෙතෙක් ගරු බුහුමන් හිසෙහි තියා
මහැදුරු ඇදුරුකම් බලුකප්පටම ගියා

පිරිසක් තවත් නූතන උපකරණ වලින්
විමසා දැනුම නවලොව විදු දැනුම තුළින්
සැරසෙති ඊට විරුදුව සටනකට කෙලින්
පිළිතුරු දෙයිද ජාතික චින්තනයෙ නලින්

ගොවියෝ පළමු අස්වැන්නෙන් පිසින ලද
කිරිබත රැගෙන ගොස් දෙවියන් කරති පුද
ඒවා බුදින දෙවියොත් මුල්ලකට වැද
වකුගඩු නරක් වී දහ දුක් විඳිති අද

පිරිසක් ආසනික් ඇත පවසති හාලේ
නැත යයි තවත් පිරිසක් පොරකති දෑලේ
මා රතු බත්ය වළඳන්නේ හැම වේලේ
ජනපති කියයි පළකොට ජාතික ආලේ

බටහිරයෝද එන් ජී ඕ කපටි හොරෑ
රට ගිනි තබති පතුරති ගල් පැලෙන බොරෑ
පරිසරවාදි හෙළ උරුමයෙ ඇමති වරෑ
සටනක් කරන්නට සැරසෙති නොසිතු විරෑ

පැතිරී ඩෙංගු උතුරයි
ඉස්පිරී තාල
වතුරලු කවලමේ
පැට්රල් වල බාල
යුද අපරාධ ගැන
මතුවෙයි ගිනි බෝල
කැවිලද රටට දැන්
දෙවියන්ගේ හාල !



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka





කාන්දම් ළමයා

අයිවන් කොළුවා ඇඟ පුරාම ඇලවුණු
හැඳි, ගෑරුප්පු, පිහියා සහ සෝස්පෑන් සමග

# Miraculous magnetic boy can carry pans on chest and 'heal the world'

## Six-year-old Croatian kid Ivan Stoiljkovic astounds his family and the people in his village, thanks to his magnetic body.

When he takes off his shirt the youngster is able to stick metallic objects such as spoons, mobile phones and even frying pans to his body.

In total, his family says, he can carry up to 25kg of metal stuck to his torso. And that isn't the end to Ivan's unusual talents. According to his family Ivan has also used his 'healing' hands to alleviate his grandfather's stomach pains and take away the pain of a neighbour who hurt his leg in a tractor accident.

Ivo, Ivan's grandfather, said when his grandson laid his hands on his stomach they became extremely hot and the pain simply went away.

If that wasn't enough, Ivan, it is also claimed, is much stronger than other children his age and is able to easily carry bags of cement as heavy as 50lbs.

# ඇඟේ කාන්දම් බලය ඇති පුදුම ළමයා

**ක්‍රො**ඒෂියාව මධ්‍යම යුරෝපයේ රටකි. අයිවන් නමැති ක්‍රොඒෂියානු ජාතික මේ ළමයාගේ වයස අවුරුදු 6 කි. එහෙත් මොහුට ලෝකයේම සිටින අන් ළමයින්ට වඩා විශේෂත්වයක් ඇත. එනම් ඔහුගේ ඇඟේ ලෝහ වර්ග ඕනෑම එකක් නිකම්ම ඇඟේ ඇලෙන කාන්දම් ශක්තියක් ඇතිවීමයි. කමීසය ගලවා හැඳි, ගෑරුප්පු, කතුරු, පිහි, සෝස් පෑන්, මොබයිල් ෆෝන්, ආයාකටු ආදී ඕනෑම ලෝහමය වස්තුවක් ඇඟට කිට්ටු කළ විට ඒ සියල්ල ඇඟේ ඇලී සිටියි. ඔහුට කිලෝ 25 ක ලෝහමය දේවල් ඇඟෙන් දරාගෙන සිටිය හැකි බව ඔහුගේ පවුලේ අය කියති.

එපමණක් ද නොව අයිවන්ට තවත් අසාමාන්‍ය බලයක් ඇත. එනම් රෝගියෙකුගේ සිරුරට අත තබා ඔහුගේ ලෙඩ සුවකරන්නට ඔහුට ඇති හැකියාවයි. තම සීයාගේ බඩේ කැක්කුමක් සෑදුණු කල අයිවන් බඩට අත තැබූ සැනින් වේදනාව නැතිවී සීයා සුවයක් ලැබූ අතර, අසල් වැසියෙකුගේ කකුලක් ට්‍රැක්ටරයක හැපී තුවාල වී වේදනාවෙන් කෑගසමින් සිටින විට අයිවන් කකුලට අත තැබූ සැනින් ඒ වේදනාව පහව ගිය බව ද පැවසේ.

අයිවන් ළමයාට ඇති තවත් හැකියාවක් නම් රා: 50 සිමෙන්ති කොට්ටයක් වුවත් පහසුවෙන් ඔසවාගෙන යාහැකි ශක්තියක් තිබීමයි. ඒ වයසේ වෙනත් කිසිම ළමයෙක් එතරම් ශක්තිමත් නැත.




**ඉරිදා- SUN** ලංකාවේ දැන් හැම කෙනෙක් අතේම මොබයිල් පෝන් එකක් තියනවයි කියලා නංගිගෙ වෙඩිං එකට ලංකාවට ගිහින් ආපු ඉන්ද්‍රාණි කිව්වා. හිඟන මිනිස්සු ළඟ පවා මොබයිල් තියනවලු. එච්චර විතරක් නෙවෙයි දඹානෙ අපේ වැදි ජනයා ළඟත් මොබයිල්. වැදි නායක වන්නිලා ඇත්තන්ට ඉන්ටනෙට් පහසුකම් ඔක්කොම එක්ක හොඳ බ්ලැක්බෙරි පෝන් එකක් කවුද ළඟදි පරිත්‍යාග කළාය කියලා මම ලංකාවෙ පත්තරේක දැක්කා. මොකද වැදි අයට කියලා මොබයිල් නරකයැ? ඒ ගොල්ල දඩයමේ හරි, මීපැණි කඩන්න හරි කැලේට ගිහිං අතරමං වුනොත් ගෙදර හාමිනේ පොජ්ජට බය නැතුව කතාකරන්න පුළුවන් මං අහවල් තැනය ඉන්නෙ කියලා. ඒ තමයි මොබයිල් එකේ වටිනාකම.

**සඳුදා- MON** මොබයිල් ටෙලිපෝන්වල වටිනාකම ගැන මෙහෙම හිත හිත ඉන්න කොට පෙරේදා මිසිස් රත්නායක කතාකරලා මගෙන් ඇහුවා ලංකාවෙන් සිද්ධාර්ථ තෙල් ටිකක් ගෙන්නලා දෙන්න පුළුවන්ද කියලා මම හා කිව්වා. මම පුරා දවසක්ම ලංකාවට කතා කරන්න මහන්සිගත්තා. අපේ ගෙදරට, ලොකු මාමලට, කාන්ති අක්කට, සුවර්ණා නංගිට, සෝමතුංග බාප්පට, රිචර්ඩ් මුදලාලිලගෙ ගෙදරට, ඔය ආදී සිය පලකට විතර. වරු වක් විතර රිං වෙනවා කවුරුවත් ගන්නෙ නෑ. ඒකෙ මෙසේජ් එකක් එනවා... "ඔබ ඇමතූ ඩයලොග් දුරකතන යෙන් ප්‍රතිචාරයක් නොමැත....කරුණාකර නැවත කතා කරන්න...". බම්බු ගහපල්ලා කියලා, මම දමලා ගහලා නිකං හිටියා. කොච්චර මොබයිල් ලංකාවට තිබුණත් ඉතිං මොකටද?

**කුජදා - TUE** ඊයෙ ගිය සතියෙ විම්බෙල්ඩන් ටෙනිස් ශූරතා තරඟ අවසන් වුණා. ගෑණු පිරිමි අංශ දෙකෙන්ම චැම්පියන්ස්ලා දෙන්නා තවත් යුරෝපීය රටවල් දෙකක දෙන්නෙක්. කාන්තාව චෙකෝස්ලෝවැකියාවෙන්. පිරිමි හාදයා සර්බියාවල කෙනෙක්. එංගලන්තෙ ටෙනිස් උපන් රට වුනාට පිටින් ඇවිල්ලා දිනලා කප් එකත් සල්ලිත් අරගෙන යනවා. මේ ආත්මෙ මෙහේ කෙනෙක් දිනයි කායලා හිතන්න අමාරුයි. අවුරුදු 72 කට ඉස්සෙල්ලා සුද්දෙක් විම්බෙල්ඩන් චැම්පියන් වෙලා තියනවා. ඊට පස්සෙ අද වෙනකල් කවුරුවත් නෑ. හැම අවුරුද්දෙම බ්‍රිතාන්‍යය බලාපොරොත්තු වෙනවා. මොන පිස්සුද අන්තිම වටේටවත් කවුරුවත් එන්නෙ නෑ. ලැබීමෙ හැටිද? නැත්නම් ලංකාවෙ කියනවා වගේ බූමියෙ දෝසයක්ද?

**බුදදා - WED** ලංකාවෙ දැන් හෙරොයින් ගංජා මත් බෙහෙත් ජාවාරම සරුවට යනවා. මන්ත්‍රීවරු ඇමතිවරු පවා වැඩේට හවුල්. ලංකා අගමැති පවා පිළිගත්තා මේක නවත්තන්න බැරි ඒ දේසපාලුවො ටික හින්දයි කියලා. මට මතකයි මේ ආණ්ඩුවෙම ඉන්න එක ඇමතියෙක් කුඩු ලාල් කියන හෙරොයින් ජාවාරම් කාරයාට ලංකාවෙ උසාවියෙ නඩුවක් තියෙද්දිත් ඌව රටෙන් පිටට යැව්වා. ඇමතියම කටුනායක ගිහිං අර කුඩ්ඩව ප්ලේන් එකේම වාඩිකරවලයි ආවේ. ඒක කවුරුත් දන්න කතාවක් ඉතින් කොහොමද ලංකාවෙ මත් බෙහෙත් වඳ කරන්නෙ? ආණ්ඩුව බොරුවට පම්පෝරි ගහනවා මතට තිත තියනවා කියලා. හැබැයි ජාවාරම ලස්සනට යනවා. දැන් ලංකාවෙ මිනිස්සු කියන්නෙ මතට තිත නෙවෙයි, තිතට මත කියලා. ඒ කියන්නෙ තිතටම වැඩේ යනවා.

**ගුරුදා - THU** අපේ සුපිරි පිතිකරු සනත් ජයසූරිය ගිය සතියෙ මෙහේ ඕවල් එකේදි ක්‍රිකට් ක්‍රීඩාවෙන් සමුගත්තා. ඒ අන්තිම මැච් එකේදි සනත් ලකුණු දෙකකට අවුට් වෙලා ගියා. මම හිතන්නෙ සනත් අයින්වෙන්න තිබුණේ ටික කාලෙකට ඉස්සෙල්ලා. කෙනෙක් විශේෂයෙන් ක්‍රීඩාවකින් විශ්‍රාම යන්න ඕන ඉහළ තැනම ඉන්න කාලෙදි තමන්ගෙ තත්වය ගෞරවය ආරක්ෂාකරගෙන. කිසිම දේකට කෑදර වෙන්න නරකයි. අපි දකිනවා සනත්ගෙ අතේ යාර ගණන් පිරිත් නූල් බැඳලා තියෙනවා. ඇයි ඕව බඳින වෙලාවෙ හාමුදුරු කෙනෙක් කිව්වෙ නැත්තෙ "ජයසූරිය මහත්තෙයා...මේ හැම දෙයක්ම අනිත්‍යයි... පවතින දේවල් නෙවෙයි...හැමදාම හයේ හතරේ පාරවල් ගහන්න බැරිවෙනවා... ලෝක ශූරයොත් බිංදුවට දෙකට අවුට් වෙලා යනවා... තමන්ගෙ හරි කාලෙ ආවම අයින් වෙන්න ඕන... නැත්නම් කනගාටුවෙන් තමයි දවසක අයින් වෙන්න වෙන්නෙ... ඒක තමයි බණේ තියෙන්නෙ"

**කිවිදා - FRI** ලොකු මල්ලිගෙන් අද ලියුමක් කඩවත කමලාවතී පුංචි අම්මලයි ගෙදෙට්ට ගිය සුමානෙ හොරු පැනලා. සාලෙ තිබ්ච්ච අළුත්ම ටෙලිවිෂන් එක්ක මුළු ගේම හොරු සුද්ද කරලා. පියසේන බාප්ප පොලීසියට ගියාම එතන ඉන්ස්පෙක්ටර් ඇහුවලු ඒ හොරු අඳුරන්න පුළුවන්ද කියලා. බාප්ප කිව්වලු අඳුරන්න නම් බෑ... ආයිත් ආවොත් මං ඒගොල්ලන්ගෙන් අයිඩෙන්ටිටි කාඩ් එක ඉල්ලගෙන මහත්තෙයගෙ අතටම ගෙනැත් දෙන්නම් කියලා. ඔන්න අපේ පොලීසිය. ඒකෙ තව පැත්තක් තියනවා...පොලීසියෙන් අපරාධකාරයෙක් අල්ලලා කූඩුවෙ දැම්මොත් ඒ යකා මන්ත්‍රීගෙ සපෝටර් කෙනෙක් නම් අර මන්ත්‍රී ඇවිත් අපරාධකාරයව බේරගෙන යනවා.